Lesson 55

# First Day At School

ස්කෝලේ පළමු දින

The bell rang to signal the end of the day. I was relieved to hear it. The few hours I had spent in this new environment felt like ages.
ද බෙල් රෑං ටු සිග්නල් දි එන්ඩ් ඔෆ් ද ඩේ . අයි වෝස් රිලීව්ඩ් ටු හියර්(ර්) ඉට් . ද ෆිව් අව(ර්)ස් අයි හෑඩ් ස්පෙන්ට් ඉන් දිස් නිව් එන්වයරමන්ට් ෆෙල්ට් ලයික් ඒජස් .

දවසේ අවසානය හැඟවීමට සීනුව නාද වුනි . එය ඇසීම මට සැනසුමක් විය. මෙම නව පරිසරයේ මා ගත කල පැය කීපය කල්පයක් මෙන් දැනුනි (signal -සංඥා කරනවා/සංඥාව ) (relieved - සැනසුමට පත් ) (ages - විශාල කාලයක් )

Everyone stopped their work and got up to recite the verses. Then they rushed out of the classroom in a great hurry
එව්රිවන් ස්ටොප්ඩ් දෙයා ව(ර්)ක් ඇන්ඩ් ගොට් අප්(ගොටප් ) ටු රිසයිට් ද ව(ර්)සස් .
දෙන් දේ රශ්ඩ් අවුට් ඔෆ් ද ක්ලාස් රූම් ඉන් අ ග්‍රේට් හරී

සියල්ලෝම වැඩ නතර කර ගාථා කීමට නැගී සිටියහ. අනතුරුව ඔවුන් මහත් හදිසියකින් පන්තියෙන් පිට වූහ. (recite -කියනවා , සජ්ජායනා කරනවා ) (verses - ගාථා / කවි පද ) (rush - ඉක්මනින් යනවා ) (hurry - ඉක්මන / හදිසිය )

This flow of students joined with another flow from upstairs, creating a mad rush down the stairway. The stream then joined students from downstairs, resulting in a big tussle at the entrance of the three-story building.
දිස් ෆ්ලෝ ඔෆ් ස්ටුඩන්ට්ස් ජොයින්ඩ් විත් අනද(ර්) ෆ්ලෝ ෆ්‍රොම් අප්ස්ටෙයා(ර්)ස් , ක්‍රියේටින් අ මෑඩ් රශ් ඩවුන් ද ස්ටෙයාවේ . ද ස්ට්‍රීම් දෙන් ජොයින්ඩ් ස්ටුඩන්ට්ස් ෆ්‍රොම් ඩවුන්ස්ටෙයාස් , රිසල්ටින් ඉන් අ බිග් ටස්ල් ඇට් දි එන්ට්‍රන්ස් ඔෆ් ද ත්‍රී ස්ටෝරි බිල්ඩින්

එම ශිෂය ප්‍රවාහය උඩුමහලින් ආ තවත් ප්‍රවාහයකට එකතු වූයේ පඩිපෙළ පහලට උමතු කඩිමුඩියක් මවමිනි . එම ප්‍රවාහය ඊළඟට පහල මාලයේ ශිෂ්‍යයන් හා එකතු වූයේ , තුන් මහල් ගොඩනැගිල්ලේ පිවිසුම අසල මහා පොරයක් නිර්මානය කරමිනි (flow - ප්‍රවාහය /ගැල්ම ) ( upstair -උඩ තට්ටුව ) (downsatir - යට තට්ටුව ) (stream -ප්‍රවාහය/ජල පහර) (tussle -පොරය )(entrance -එන්ට්‍රන්ස් - පිවිසුම ) (story - බිල්ඩිමක තට්ටුව/ කතාව )

Everyone was trying to exit at the same time. Hidden among this rushing crowd , I felt like an unknown figure.
එව්රිවන් වෝස් ට්‍රයිං ටු එක්සිට් ඇට් ද සේම් ටයිම්. හිඩින් අමං දිස් රෂිං ක්‍රව්ඩ් , අයි ෆෙල්ට් ලයික් ඇන් අන්නෝ(ව්)න් ෆිග(ර්)

සියලු දෙනාම එකවර පිට වීමට උත්සාහ කරමින් සිටියහ . මේ කඩිමුඩි සෙනග අතර සැඟව , මට දැනුනේ මා නන්නාඳුනන තැනැත්තෙකු මෙනි (exit - පිට වෙනවා ) (hidden - සැඟවුණු ) (unknown - නොදන්නා ) (figure - පුද්ගල රූපය )

It had  only been a few hours since I entered this new environment. In short, it was my first day at the new school.
ඉට් හෑඩ් ඔන්ලි බීන් අ ෆිව් අව(ර්)ස් සින්ස් අයි එන්ට(ර්)ඩ් දිස් එන්වයරමන්ට් . ඉන් ෂෝට්, ඉට් වෝස් මයි ෆස්ට් ඩේ ඇට් ද නිව් ස්කූල්

මා මේ නව පරිසරයට ඇතුලත් වූ මොහොතේ සිට ගතව තිබුනේ පැය කීපයක් පමණී . කෙටියෙන් කිවහොත් , ඒ අලුත් පාසලේ මගේ පළමු දිනයයි (enter - ඇතුල් වෙනවා ) (in short - කෙටියෙන් )

So far, things were alright, but I felt odd. I hadn't made friends in my new class yet.
සෝ ෆා , තිංග්ස් ව(ර්) ඕල්රයිට්. බට් අයි ෆෙල්ට් ඔඩ් . අයි හැඩ්න්ට් මේඩ් ෆ්‍රෙන්ඩ්ස් ඉන් මයි නිව් ක්ලාස් යෙට්

මේ දක්වා සියල්ල හොදින් සිදුවුනි . නමුත් මට මහා අමුත්තක් දැනුනි . මා තවමත් මගේ අලුත් පන්තියේ යහළුවන් ඇතිකරගෙන නොතිබුණි (odd - අමුතු , නුහුරු , අරුම )

One or two boys exchanged friendly words with me during the interval, but the others didn't seem to care about me. I felt awkward
වන් ඕ ටූ බෝයිස් එක්ස්චේන්ඩ් ෆ්‍රෙන්ඩ්ලි ව(ර්)ඩ්ස් විත් මී ඩියුරින් ද ඉන්ටවල් , බට් දි අද(ර්)ස් ඩිඩ්න්ට් සීම් ටු කෙයා(ර්) අබවුට් මී. අයි ෆෙල්ට් ඔක්ව(ර්)ඩ්

සිසුන් එක්කෙනෙක් දෙන්නෙක් විවේක කාලයේදී මා සමග මිතුරු වදනක් දෙකක් හුවමාරු කරගත්හ. නමුත් අනිත් අය මා ගණන් ගන්න බවක් නොපෙනුණි . මට මහා අපහසු ගතියක් දැනුනි (awkward - අමුතු , නුහුරු, අපහසු බවක් දෙන )

I had attended my old school from from day one until year 9, when my father decided to send  me to this big school in the town
අයි හෑඩ් ඇටෙන්ඩඩ් මයි ඕල්ඩ් ස්කූල් ෆ්‍රොම් ඩේ වන් අන්ටිල් ඉය(ර්) නයින් , වෙන් මයි ෆාද(ර්) ඩිසයිඩඩ් ටු සෙන්ඩ් මී ටු දිස් බිග් ස්කූල් ඉන් ද ටවුන්

මගේ පියා නගරයේ මෙම ලොකු ඉස්කෝලයට මා යවන්නට තීරණය කරන විට , පළමු දිනයේ සිට(පාසල් ජීවිතයේ) නමය වසර දක්වාම මා මගේ පරණ පාසලට ගොස් තිබුණි (attend - සහභාගී වෙනවා ) (decide - තීරණය කරනවා )

I didn't like the idea at all. In my old school, I was loved by everyone, teachers and students alike
අයි ඩිඩ්න්ට් ලයික් දි අයිඩියා ඇට් ඕල්(ඇටෝල්). ඉන් මයි ඕල්ඩ් ස්කූල්, අයි වෝස් ලව්ඩ් බයි එව්රිවන් ,ටීච(ර්)ස් ඇන්ඩ් ස්ටුඩන්ට්ස් අලයික්

මම කිසිසේත්ම එම අදහසට කැමති නොවුනෙමි . මගේ පරණ පාසලේදී මම ගුරු ශිෂ්‍ය දෙගොල්ලන්ගේම එකලෙස ආදරයට ලක් වුනෙමි (at all - කොහෙත්ම ) (alike - සමාන , එක වගේම )

Here, I was a timid newcomer. At my old school, I was one of the best; here, I might not be good enough
හියර්(ර්) , අයි වෝස් අ ටිමිඩ් නිව් කම(ර්) . ඇට් මයි ඕල්ඩ් ස්කූල්, අයි වෝස් වන් ඔෆ් (වනොෆ්) ද බෙස්ට්; හියර්(ර්) අයි මයිට් නොට් බී ගුඩ් ඉනෆ්

මෙහිදී , මම බයාදු අලුත ආ එකෙකි .මගේ පරණ පාසලේදී මම හොදම අයගෙන් එකෙකු වීමි, මෙහිදී මා එතරම්ම හොඳ නොවීමට පුළුවන (timid - බයාදු / බියගුළු )

As I got closer to the main entrance of the building, I heard someone call, "Hey, newcomer, stop!" The voice came from halfway up the stairway
ඈස් අයි ගොට් ක්ලෝස(ර්) ටු ද මේන් එන්ට්‍රන්ස් ඔෆ් ද බිල්ඩින් , අයි හ(ර්)ඩ් සම්වන් කෝල් ," හේ, නිව්කම(ර්), ස්ටොප් ! " ද වොයිස් කේම් ෆ්‍රොම් හාෆ් වේ අප් ද ස්ටෙයා(ර්) වේ

මා ගොඩනැගිල්ලේ ප්‍රධාන පිවිසුමට ලඟා වත්ම යමෙකු හඬ ගසනු මට ඇසුනි " ඒයි , අලුතින් ආපු එකා , ඔහොම හිටපන් ! " කටහඬ පැමිණියේ පඩි පෙලේ මැද හරියෙනි (halfway - බාගයක් දුර )

I instantly turned and looked up. There was a rowdy - looking guy from an upper grade climbing down the stairs
අයි ඉන්ස්ටන්ට්ලි ට(ර්)න්ඩ් ඇන්ඩ් ලුක්ඩ් අප්. දෙයා(ර්) වෝස් අ රවුඩි ලුකිං ගයි ෆ්‍රොම් ඇන් අප(ර්) ග්‍රේඩ් ක්ලයිබිං ඩවුන් ද ස්ටෙයා(ර්)ස්

මම වහා ආපසු හැරී බැලුවෙමි .මැර පෙනුමින් යුත් අපට ඉහල පන්තියේ කොල්ලෙකු පඩිපෙළ බසිමින් සිටියේය (instantly - ක්ෂණිකව ) (rowdy- චන්ඩියා , මැරයා ) (upper - ඉහල)

He was of medium height with a stout body, and he was staring directly at me. I sensed something unpleasant was about to happen
හී වෝස් ඔෆ් මීඩියම් හයිට් විත් අ ස්ටවුට් බොඩි , ඇන්ඩ් හී වෝස් ස්ටෙයාරිං ඩිරෙක්ට්ලි ඇට් මී. අයි සෙන්ස්ඩ් සම්තිං අන්ප්ලෙසන්ට් වෝස් අබවුට් ටු හැපන්

ඔහු මධ්‍යම ප්‍රමාණයේ උසකින් හා හැඩි දැඩි සිරුරකින් යුතු අයෙකි . ඔහු කෙලින්ම මා දෙස ඇස් යොමා බලා සිටියේය. යම් අප්‍රසන්න දෙයක් සිදුවීමට ආසන්න බව මට දැනුනි (hight - උස ) (stout - තරමක් මහත සහ ශක්තිමත්) (stare - රවා බලනවා ) (directly - කෙලින්ම) (sense - දැනෙනවා ) (උන්ප්ලේඅසන්ට්- අප්‍රසන්න ) (happen - සිදුවෙනවා )

I wanted to avoid his attention, so I looked away and began to move again. I wasn't sure he was talking to me anyway
අයි වෝන්ටඩ් ටු අවොයිඩ් හිස් අටෙන්ෂන් , සෝ අයි ලුක්ඩ් අවේ ඇන්ඩ් බිගෑන් ටු මුව් අගේන් . අයි වොස්න්ට් ෂුව(ර්) හී වෝස් ටෝකිං ටු මී එනිවේ

මට ඔහුගේ අවධානය මග හැරීමට අවශ්‍ය විය, ඒ නිසා මම අහක බලා ගෙන යලි ගමන් කිරීමට පටන් ගතිමි.කොහොමත් ඔහු කතා කරන්නේ මට යැයි මට හරියටම විශ්වාසයක් නොතිබුණි (avoid - මග හරිනවා ) (attention - අවධානය )

“Hey, I’m talking to you, the newcomer!” he shouted again. I looked back. His fierce look was fixed on me. Now I was sure he was shouting at me.
“හේ , අයෑම් ටෝකිං ටු යූ , ද නිව් කම(ර්) ! “ හී ශවුටඩ් අගේන් . අයි ලුක්ඩ් බැක් . හිස් ෆියු(ර්)ස් ලුක් වෝස් ෆික්ස්ඩ් ඔන් මී . නව් අයි වෝස් ෂුව(ර්) හී වෝස් ෂවුටින් ඇට් මී
“ඒයි , මම උඹට කතා කරන්නේ , අලුතෙන් ආව එකා ! “ඔහු යලි කෑගැසුවේය. මම හැරී බැලුවෙමි. ඔහුගේ රුදුරු බැල්ම යොමුවී තිබුනේ මා දෙසටය. ඔහු කෑගසන්නේ මට බව දැන් මට හොදටම විශ්වාසය (shout - කෑගහනවා) (fierce - දරුණු )

“Stop, idiot !” I froze for a moment. He climbed down the steps and approached me
“ස්ටොප් , ඉඩියට් !” අයි ෆ්‍රෝස් ෆෝ අ මෝමන්ට් . හී ක්ලයිම්ඩ් ඩවුන් ද ස්ටෙප්ස් ඇන්ඩ් අප්‍රෝච්ඩ් මී

“නැවතියන් , මෝඩයා !” මම මොහොතකට ගල් ගැසුනෙමි . ඔහු පඩිපෙලින් බැස මා වෙත ආවේය (idiot - මෝඩයා ) (freeze - මිදෙනවා/ froze - මිදුනා ) (climb down - පහත නහිනවා ) (approach - ලගා වෙනවා )

Other students had also stopped and gathered around us.Now I recognized several faces around the scene, there were also a few of my classmates sneering at me

අද(ර්) ස්ටුඩන්ට්ස් හෑඩ් ඕල්සෝ ස්ටොප්ඩ් ඇන්ඩ් ගැද(ර්)ඩ් අරවුන්ඩ් අස් . නව් අයි රෙකග්නයිස්ඩ් සෙවරල් ෆේසස් අරවුන්ඩ් ද සීන් , දෙයා(ර්) ව(ර්) ඕල්සෝ අ ෆිව් ඔෆ් මයි ක්ලාස් මේට්ස් ස්නියරිං ඇට් මී

අනෙක් සිසුන්ද නැවතී අප වටා රොක් වූහ . මේ සිද්ධිය අවට සිටි මුහුණු කීපයක් මම දැන් හඳුනා ගතිමි. මගේ පන්තියේ සගයන් කීප දෙනෙක්ද මා දෙස විරිත්තමින් බලා සිටියහ

“What is your name, new comer ?” He asked .
“වට් ඉස් යුව(ර්) නේම් , නිව් කම(ර්) ? “හී ආස්ක්ඩ්
“උඹේ නම මොකක්ද අලුත් එකෝ “ ඔහු ඇසුවේය

“Supun,” I said timidly.
“සුපුන්” අයි සේඩ් ටිම්ඩිලි
“සුපුන්” මම බයාදු ලෙස කීවෙමි

“Chupun? So you are Chupun. What a funny name !” the bully said. Everyone around us burst out laughing. I felt so ashamed
“චුපුන් ? සෝ යූ ආ චුපුන් .වට් අ ෆනි නේම් ! “ ද බුලී සේඩ් . එව්රිවන් අරවුන්ඩ් අස් බ(ර්)ස්ට් අවුට් ලාෆිං . අයි ෆෙල්ට් සෝ අශේම්ඩ්

“චුපුන් ? එහෙනම් උඹ චුපුන් . මාර විහිලු නමක්නේ !” මැරයා කීවේය . හැමෝම මහා හඩින් සිනාසුනහ. මට මහත් ලැජ්ජාවක් දැනුනි (burst out laughing කියන්නේ එක පාරට මහා හයියෙන් හිනා වෙනවා කියන කියන එක )

“Which school did you come from ?” he asked again.
“විච් ස්කූල් ඩිඩ් යූ කම් ෆ්‍රොම් ? “හී ආස්ක්ඩ් අගේන්
“මොන ස්කෝලෙන්ද උඹ ආවේ ?” ඔහු යලි ඇසුවේය

“From Horawala school,” I replied, my voice shaking.
“ෆ්‍රොම් හොරවල ස්කූල් , “ අයි රිප්ලයිඩ් , මයි වොයිස් ශේකිං
“හොරවල ස්කොලේ ඉදන් ! “වෙව්ලන හඬින් මම පිළිතුරු දුනිමි

“Horawala school? What a dirty school that is,” He said sarcastically. The children watching around laughed out again
“හොරවල ස්කූල් ? වට් අ ඩ(ර්)ටි ස්කූල් දැට් ඉස් “‘ හී සේඩ් සාකැස්ටිකලි. ද චිල්ඩ්‍රන් වොචිං අරවුන්ඩ් ලාෆ්ඩ් අවුට් අගේන්

“හොරවල ස්කෝලෙන් ? මොන ජරා ස්කොලයක්ද ඒ ? “ ඔහු උපහාසාත්මකව කීවේය. අවට සිද්ධිය නරඹමින් සිටි ළමුන් යලි සිනාසුනහ .

“You were schooled at Horawala ? So you’re a thief.” Laughs rose again from all around .You don’t fit in here, new comer. Why did you come here at all?”
යූ ව(ර්) ස්කූල්ඩ් ඇට් හොරවල ? සෝ යූ ආ අ තීෆ් “. ලාෆ්ස් රෝස් අගේන් ෆ්‍රොම් ඕල් අරවුන්ඩ් . යූ ඩෝන්ට් ෆිට් ඉන් හියර්) නිව් කම(ර්) . වයි ඩිඩ් යූ කම් හිය(ර්) ඇට් ඕල් ?”

“උඹ ස්කොලේ ගියේ හොරවල ? ඒ කියන්නේ උඹ හොරෙක් “ . වට පිටින් යලි සිනා නැගුණි .
“උඹව මෙහෙට ගැලපෙන්නේ නෑ අලුත් එකෝ . ඇත්තට උඹ මොකද මෙහෙ ආවේ ? “

There were giggles around. I didn’t answer him. Instead, I looked at him timidly.
දෙයා ව(ර්) ගිග්ල්ස් අරවුන්ඩ් . අයි ඩිඩ්න්ට් ආන්ස්ව(ර්) හිම් . ඉන්ස්ටෙඩ් , අයි ලුක්ඩ් ඇට් හිම් ටිමිඩ්ලි

වට පිටින් හිකි හිකි නාදය ඇසුනි . මම ඔහුට පිළිතුරු නොදුන්නෙමි . ඒ වෙනුවට මම බයාදු ලෙස ඔහු දෙස බැලුවෙමි

I didn’t have the courage to speak. I felt so helpless
අයි ඩිඩ්න්ට් හැව් ද කරේජ් ටු ස්පීක් . අයි ෆෙල්ට් සෝ හෙල්ප්ලස්
මට කතා කරන්නට ධෛර්යයක් නොතිබුණි . මට මහත් අසරණ කමක් දැනුනි

“Speak up, man !” He thundered. “Why did you come here?”
“ස්පීක් අප් මෑන් !” හී තන්ඩ(ර්)ඩ්. ”වයි ඩිඩ් යූ කම් හිය(ර්) ?”
“කතා කරපන් මිනිහෝ !” , ඔහු ගුගුලේය . “උඹ මොකද මෙහෙ ආවෙ ?”

By now, I was shaking. I felt like crying. Some girls passing by looked at me sympathetically
බයි නව් , අයි වෝස් ශේකිං , අයි ෆෙල්ට් ලයික් ක්‍රයිං . සම් ග(ර්)ල්ස් පාසිං බයි ලුක්ඩ් ඇට් මී සිම්පතටිකලි

මේ වෙනවිට මම වෙව්ලමින් සිටියෙමි . මට හැඬුම් එන්නට මෙන් දැනුනි . අසලින් ගිය ඇතැම් ගැණු ළමයි මා දෙස අනුකම්පා සහගත ලෙස බැලූහ ( sympathetic - සිම්පතටික් - අනුකම්පා සහගත ) ( sympathetically - සිම්පතටිකලි - අනුකම්පා සහගත ලෙස )

“Can’t you open your mouth ?” The bully got angrier
“කාන්ට් යූ ඕපන් අප් යුව(ර්) මවුත් ? “ ද බුලි ගොට් ඇංග්‍රිය(ර්)
“උඹට කට අරින්න බැරිද ?” මැරයා තවත් කෝපයට පත් විය

I didn’t know what to say. I kept looking down, feeling utterly helpless
අයි ඩිඩින්ට් නෝ වට් ටු සේ . අයි කෙප්ට් ලුකිං ඩවුන් , ෆීලිං අට(ර්)ලි හෙල්ප්ලස්
කුමක් කියන්න දැයි මම නොදැන සිටියෙමි .එහෙම්පිටින්ම අසරණව මම බිම බලාගෙනම සිටියෙමි

“Speak up, man “. He thundered again . I kept silent
“ස්පීක් අප් මෑන් “. හී තන්ඩ(ර්)ඩ් අගේන් . අයි කෙප්ට් සයිලන්ට්
“කතා කරපන් , මිනිහෝ “. ඔහු යලි ගුගුලේය . මම නිහඬව සිටියෙමි

“Do you know who I am ?” he asked
“ඩු යූ නෝ හූ අයෑම් ? “හී ආස්ක්ඩ්
“උඹ දන්නවද මම කව්ද කියලා ? “ ඔහු ඇසුවේය

I shook my head saying “ no “
අයි ෂුක් මයි හෙඩ් සේයිං “ නෝ “
මම නැතැයි කියමින් මගේ හිස සෙලවූවෙමි

“I am Mr. Dalugoda . Everybody calls me the boss here. This is my squad “ He said pointing to the boys around him
“අයෑම් මිස්ට(ර්) දලුගොඩ . එව්රිබොඩි කෝල්ස් මී ද බොස් හිය(ර්) . දිස් ඉස් මයි ස්කොඩ් “. හී සේඩ් පොයින්ටිං ද බෝයිස් අරවුන්ඩ් හිම්

“මම මිස්ට දලුගොඩ . මෙහෙ හැමෝම මට කියන්නේ බොස් (ලොක්කා) කියල. මේ ඉන්නේ මගේ පිරිවර “ ඔහු අවට සිටි ළමුන් පෙන්වමින් ඔහු කීවේය

“I order that you stop attending this school from tomorrow . Don’t let me catch you around here again. Did you hear me ?”

“ අයි ඕඩ(ර්) දැට් යූ ස්ටොප් අටෙන්ඩිං දිස් ස්කූල් ෆ්‍රොම් ටුමෝරෝ. ඩෝන්ට් ලෙට් මී කැච් යූ අරවුන්ඩ් හියර්) අගේන්. ඩිඩ් යූ හියර්) මී ?”

“මම උබට අණ කරනවා හෙට සිට මේ ඉස්කෝලෙට එන එක නතර කරන්න ඕන කියලා . ආයිත් මෙහෙදී මට අහුවෙන්න එපා . ඇහුනද මම කියපු දේ ? “

“Aiye !” someone called. I looked up at the staircase. A pleasant, decent-looking boy was climbing down the stairs with an attendance register in his hand
“අයියේ ! “ සම්වන් කෝල්ඩ් . අයි ලුක්ඩ් අප් ඇට් ද ස්ටේයා(ර්) කේස් . අ ප්ලෙසන්ට්, ඩීසන්ට් ලුකිං බෝයි වෝස් ක්ලයිම්බිං ඩවුන් ද ස්ටෙයා(ර්)ස් විත් ඇන් අටෙන්ඩන්ස් රෙජිස්ට(ර්) ඉන් හිස් හෑන්ඩ්

“අයියේ !” යමෙකු කතා කළේය . මම පඩිපෙල දෙස බැලීමි . ප්‍රසන්න විනීත පෙනුමැති පිරිමි ළමයෙක් නාම ලේඛනයක් අතැතිව පඩිපෙළ බසින් සිටියේය

I recognized him as my class monitor, though I still didn’t know his name
අයි රෙකග්නයිස්ඩ් හිම් ඈස් මයි ක්ලාස් මොනිට(ර්) , දෝ අයි ස්ටිල් ඩිඩින්ට් නෝ හිස් නේම්
තවමත් මම ඔහුගේ නම නොදැන සිටියත් ඔහු මගේ පන්ති නායකයා බව මම හඳුනා ගතිමි

“Please, He is a friend of mine. Please don’t trouble him,” He pleaded with the bully
“ප්ලීස් , හී ඉස් අ ෆ්‍රෙන්ඩ් ඔෆ් මයින් , ප්ලීස් ඩෝන්ට් ට්‍රබල් හිම් “ හී ප්ලීඩඩ් විත් ද බුලි
“එයා මගේ යාලුවෙක් . එයාට කරදර කරන්න එපා .” ඔහු අයාචනා කළේය

“Is that so , Malli ? Is he a friend of yours ? Then, No problem. I will let him go, but I just gave him an order. He must obey it , okay?”
“ඉස් දැට් සෝ, මල්ලි ? ඉස් හී අ ෆ්‍රෙන්ඩ් ඔෆ් යුව(ර්)ස් ?, දෙන් , නෝ ප්‍රොබ්ලම් , අයි විල් ලෙට් හිම් ගෝ බට් අයි ජස්ට් ගේව් හිම් ඇන් ඕඩ(ර්) , හී මස්ට් ඔබේ ඉට් , ඕ කේ ?

“එහෙමද මල්ලි , එයා ඔයාගේ යාලුවෙක්ද ? එහෙනම් ප්‍රශ්නයක් නෑ , මම එයාට යන්න දෙන්නම් . නමුත් මම දැන් එයාට නියෝගයක් දුන්නා , එයා ඒක පිළිපදින්න ඕන , හරිද ?”

“ No problem Aiye , I will ensure that “ He said with a grin on his face
“නෝ ප්‍රොබ්ලම් අයියේ. අයි විල් එන්ෂුව(ර්) දැට් “ හී සේඩ් විත් අ ග්‍රින් ඔන් හිස් ෆේස්
“ප්‍රශ්නයක් නෑ අයියේ , මම ඒ ගැන බලා ගන්නම් “. සිනාවක් මුව රදවා ගෙන ඔහු කීවේය

The bully let go of me and walked away with his squad . Everyone else left the scene in a second. I was greatly relieved.

ද බුලි ලෙට් ගෝ ඔෆ් මී ඇන්ඩ් වෝක්ඩ් අවේ විත් හිස් ස්කොඩ් . එව්රිවන් එල්ස් ලෙෆ්ට් ද සීන් ඉන් අ සෙකන්ඩ් . අයි වෝස් ග්‍රේට්ලි රිලීව්ඩ්

මැරයා  මා අතහැර ඔහුගේ පිරිවර සමග ඉවත ගියේය . අනෙක් සියලු දෙනාද ක්ෂණයෙන් එතැනින් ඉවත්ව ගියහ . මට මහත් සහනයක් දැනුනි

The class monitor came to me, gave a friendly smile,  and patted me on the back.
ද ක්ලාස් මොනිට(ර්) කේම්  ටු මී , ගේව්  අ ෆ්‍රෙන්ඩ්ලි ස්මයිල්  ඇන්ඩ් පැටඩ් මී  ඔන්  ද බැක්
පන්ති නායකයා මා වෙත පැමිණ සුහද සිනාවක් පල කර මගේ පිටට තට්ටුවක් දැමුවේය

"Don't worry. He is Amal, a bully from year 10. He is just having some fun . He will not come to bully you again."
"ඩෝන්ට් වොරි. හී  ඉස් අමල් , අ බුලි ෆ්‍රොම් ඉය(ර්) ටෙන් . හී ඉස් ජස්ට් හැවිං සම් ෆන් .
හී  විල් නොට්  කම් ටු බුලි යූ අගේන් "

බය වෙන්න එපා . ඒ අමල් , දහය වසරේ චන්ඩියෙක්  . එයා ඔය විනොදෙට කරන්නේ . එයා ආපහු එන්නේ නැහැ ඔයාව බය  කරන්න"

That was my first encounter with Saman. I was amazed at  the way he dealt with the  bully. He did it with such confidence that even the bully heeded his word. No one else would do that with a bully from an  upper grade
දැට්  වෝස් මයි ෆස්ට් එන්කවුන්ට(ර්) විත් සමන් . අයි වෝස් අමේස්ඩ් ඇට්  ද වේ
හී  ඩෙල්ට්  විත් ද බුලි . හී  ඩිඩ්  ඉට්  විත් සච් කොන්ෆිඩන්ස් දැට් ඊවන්  ද බුලී  හීඩඩ් හිස්
ව(ර්)ඩ්ස්.  නෝ වන්  එල්ස්  වුඩ් ඩූ  දැට් විත් අ බුලී  ෆ්‍රොම් ඇන් අප(ර්) ග්‍රේඩ්

ඒ සමන් සමග  මගේ ප්‍රථම හමුවීමයි. චන්ඩියා  සමග ඔහු ගනුදෙනු කල ආකාරය ගැන මම පුදුම වීමි. ඔහු පුදුම ආත්ම  විශ්වාසයකින් එය කල අතර මැරයා  පවා ඔහුගේ වචනය පිළිගත්තේය. වෙන කිසිවෙකු ඉහල පන්තියක මදාවියෙකු  සමග එය නොකරනු ඇත.

**Language Focus**

- ඉහත කෙටි කතාවේ පළමු ජේදයේම  ආපු මේ වාක්‍යය බලන්න

I was relieved to hear it
අයි වෝස්  රිලීව්ඩ් ටු හියර්) ඉට්
ඒක ඇසීම මට සහනයක් වුනා

- ඒ රටාවටම තවත් වාක්‍යය කීපයක් ගෙන බලමු

I was happy to see her
අයි වෝස්  හැපි ටු සී  හ(ර්)
ඇයව  දැකීමෙන් මම සතුටට පත් වුනා

He was sorry to hear the news
හී වෝස් සොරි ටු හියර්(ර්) ද නිව්ස්
ආරංචිය ඇසීමෙන් ඔහු කණගාටුවට පත් වුනා

She was proud to win the prize
ෂී වෝස් ප්‍රවුඩ් ටු වින් ද ප්‍රයිස්
ඇය ආඩම්බරයට පත් වුනා ත්‍යාගය දිනීම ගැන

- ඒ උදාහරණ අතීත කාලයේ ඒවා . මෙහි වර්තමාන කාල උදාහරණ දෙක තුනකුත් ගනිමු

We are glad to help you
වී ආ ග්ලෑඩ් ටු හෙල්ප් යූ
ඔබට උදව් කරන්න ලැබීම ගැන අපට සතුටුයි

I am happy to see you
අයෑම් හැපී ටු සී යූ
ඔයාව දැකීම ගැන මට සතුටුයි

I am sorry to hear that
අයෑම් සොරි ටු හියර්(ර්) දැට්
මට කණගාටුයි ඒ ගැන අහන්න

- ඊළඟට මේ වාක්‍යය බලන්න .

But the others didn't seem to care about me
බට් දි අද(ර්)ස් ඩිඩ්න්ට් සීම් ටු කෙයා(ර්) අබවුට් මී
නමුත් අනිත් අය මා ගණන් ගන්න බවක් නොපෙනුණි

- seem කියන වචනේ තේරුම "වගේ පෙනෙනවා " . අපි මේ වචනේ දන්නවා . මිට කලින් seem එන වාක්‍යය අපිට හමුවුනා . seem වල අතීත කාලේ seemed -සීම්ඩ්

He seemed to like it
හී සීම්ඩ් ටු ලයික් ඉට්
ඔහු ඊට කැමතියි වගේ පෙනුනේ

දැන් එහි නතාර්ථය ගනිමු

He didn't seem to like it
හී ඩිඩ්න්ට් සීම් ටු ලයික් ඉට්
ඔහු ඊට කැමති වගක් පෙනුනේ නැහැ

- මේ උදාහරණත් බලන්න

She didn’t seem to understand the question
ෂී ඩිඩ්න්ට් සීම් ටු අන්ඩස්ටෑන්ඩ් ද ක්වෙස්චන්
ඇයට ප්‍රශ්නය තේරුණු බවක් පෙනුනේ නැහැ

They didn’t seem to enjoy the movie
දේ ඩිඩ්න්ට් සීම් ටු එන්ජෝයි ද මූවී
ඔවුන් චිත්‍රපටිය වින්දනය කරන බවක් පෙනුනේ නැහැ

He didn’t seem to recognize me.
හී ඩිඩ්න්ට් සීම් ටු රෙකග්නයිස් මී
ඔහු මා අඳුනාගත් බවක් පෙනුනේ නැහැ

He didn’t seem to hear what I said
හී ඩිඩ්න්ට් සීම් ටු හියර්(ර්) වට් අයි සේඩ්
ඔහුට මම කියූ දෙය ඇහුනේ නෑ වගේ

She didn’t seem to believe my story
ෂී ඩිඩ්න්ට් සීම් ටු බිලීව් මයි ස්ටෝරි
ඇය මගේ කතාව විශ්වාස කරන්නේ නෑ වගේ පෙනුනේ

- මේ රටාවේම වර්තමාන කාල වාක්‍යය දෙකක් ගෙන බලමු

He seems to like it
හී සීම්ස් ටු ලයික් ඉට්
ඔහු ඊට කැමතියි වගේ

He doesn’t seem to like it
හී ඩස්න්ට් සීම් ටු ලයික් ඉට්
ඔහු ඊට කැමති බවක් පෙන්නේ නැහැ (ඔහු ඊට කැමති නෑ වගේ )

- තවත් වාක්‍යය දෙකක් ගනිමු

She seems to understand it
ෂී සීම්ස් ටු අන්ඩස්ටෑන්ඩ් ඉට්
ඇයට ඒක තේරෙනවා වගේ

She doesn’t seem to understand it
ෂී ඩස්න්ට් සීම් ටු අන්ඩස්ටෑන්ඩ් ඉට්
ඇයට ඒක තේරෙන බවක් පේන්නේ නෑ

- මීලගට මේ වාක්‍යය දෙක දිහා බලන්න

The bully let go of me and walked away with his squad
ද බුලි ලෙට් ගෝ ඔෆ් මී ඇන්ඩ් වෝක්ඩ් අවේ විත් හිස් ස්කොඩ්
මැරයා මා අතහැර ඔහුගේ පිරිවර සමග ඉවත ගියේය

The class monitor came to me, gave a friendly smile, and patted me on the back.
ද ක්ලාස් මොනිට(ර්) කේම් ටු මී , ගේව් අ ෆ්‍රෙන්ඩ්ලි ස්මයිල් ඇන්ඩ් පැටඩ් මී ඔන් ද බැක්
පන්ති නායකයා මා වෙත පැමිණ සුහද සිනාවක් පල කර මගේ පිටට තට්ටුවක් දැමුවේය .

පළමු වාක්‍යයේ මැරයා ඔහුව අතහැර ඉවත ගිහින් තියෙනවා . ඒ කියන්නේ ඉස්සෙල්ලා
ඇත හැරලා ඊළගට ඉවත ගිහින් තියෙනවා .
දෙවැනි වාක්‍යයේ එයා මිත්‍රශීලි සිනහවක් පාල පිටට තට්ටුවක් දාල තියෙනවා .
පළමුවෙනි ක්‍රියාව කරලා තමයි දෙවැනි ක්‍රියාව කරලා තියෙන්නේ
එක ක්‍රියාවක් කරලා , ඊළගට තව ක්‍රියාවක් කරන කොට ඒ දෙක සම්බන්ධ වෙන්නේ
and වලින් . සම්බන්ධක පද පිලිබඳ පාඩමේදී අපි මෙය ඉගෙන ගත්තා

- මේ උදාහරණ බලන්න

He closed the door and went away
හී ක්ලෝස්ඩ් ද ඩෝ ඇන්ඩ් වෙන්ට් අවේ
ඔහු දොර වහල ඉවත ගියා

She lit the oven and put the pot on it
ෂී ලිට් ද අවන් ඇන්ඩ් පුට් ද පොට් ඔන් ඉට්
ඇය ලිප පත්තු කරලා වළඳ ඒක උඩින් තිව්වා (light -ලයිට් - පත්තු කරනවා , එහි අතීත කාලය
lit - ලිට් - පත්තු කළා )

I rang the bell and got off the bus
අයි රෑං ද බෙල් ඇන්ඩ් ගොටෝෆ් ද බස්
මම බෙල් එක ගහලා බස් එකෙන් බැස්සා

We opened the gate and entered
වී ඕපන්ඩ් ද ගේට් ඇන්ඩ් එන්ට(ර්)ඩ්
අපි ගේට්ටුව ඇරලා ඇතුල් වුනා

I switched off the light and went to bed
අයි ස්විච්ඩ් ඕෆ් ද ලයිට් ඇන්ඩ් වෙන්ට් ටු බෙඩ්
මම ලයිට් එක නිවලා ඇඳට ගියා

- ඉහත වාක්‍යය රටාවන්ට අමතරව මේ කෙටි කතාවේ ජේදයන් තුල අපට හමුවූ මෙන්න මේ වාක්‍යය ටිකත් මතකයේ තබා ගැනීමට හොඳ වාක්‍යය බව කිව යුතුයි

I felt awkward
අයි ෆෙල්ට් ඔක්ව(ර්)ඩ්
මට මහා අමුත්තක් ( නුහුරු , නොගැලපෙන ගතියක් ) දැනුනි

Then they rushed out of the classroom in a great hurry
දෙන් දේ රශ්ඩ් අවුට් ඔෆ් ද ක්ලාස් රූම් ඉන් අ ග්‍රේට් හරී
අනතුරුව ඔවුන් මහත් හදිසියකින් පන්තියෙන් පිට වූහ

I didn't like the idea at all
අයි ඩිඩින්ට් ලයික් දි අයිඩියා ඇට් ඕල්(ඇටෝල්)
මම කිසිසේත්ම එම අදහසට කැමති නොවුනෙමි

I felt so ashamed.
අයි ෆෙල්ට් සෝ අශේම්ඩ්
මට මහත් ලැජ්ජාවක් දැනුනි

I felt so helpless.
අයි ෆෙල්ට් සෝ හෙල්ප්ලස්
මට මහත් අසරණ කමක් දැනුනි

By now, I was shaking
බයි නව් , අයි වෝස් ශේකිං,
මේ වෙනවිට මම වෙව්ලමින් සිටියෙමි.

Is that so ?
ඉස් දැට් සෝ ?
එහෙමද ?

I didn't know what to say
අයි ඩිඩින්ට් නෝ වට් ටු සේ
කුමක් කියන්න දැයි මම නොදැන සිටියෙමි

I kept silent
අයි කෙප්ට් සයිලන්ට්
මම නිහඬව සිටියෙමි

Do you know who I am ?
ඩු යූ නෝ හූ අයෑම් ?
උබ දන්නවද මම කව්ද කියලා ?

Don't let me catch you again.
ඩෝන්ට් ලෙට් මී කැච් යූ අගේන්
ආයිත් මට අහුවෙන්න එපා

Did you hear me ?
ඩිඩ් යූ හියර්(ර්) මී ?
උඹට මාව ඇහුනද ? (ඇහුනද මම කියපු දේ ? )

Please don't trouble him
ප්ලීස් ඩෝන්ට් ට්‍රබල් හිම්
කරුණාකර ඔහුට කරදර කරන්න එපා

**Vocabulary 55**

end - එන්ඩ් - අවසානය

ages - ඒජස් - බොහෝ දීර්ග කලක්

spend - ස්පෙන්ඩ් - ගත කරනවා (spent - අතීත )

recite - රිසයිට් - කටපාඩමින් කියාගෙන යනවා

verses - ව(ර්)සස් - පද පේලි , ගාථා

great - ග්‍රේට් - මහත් , විශාල

stairs - ස්ටේයාස් - පඩිපෙළ

stairway - ස්ටේයාවේ - පඩිපෙළ

push - පුෂ් - තල්ලු කරනවා

pull - පුල් - අදිනවා

hide - හයිඩ් - හංගනවා , හැංගෙනවා

hidden - හිඩ්න් - සැඟවුනු

known - නෝ(ව්)න් - දන්නා

unknown - අන්නෝ(ව්)න් - නොදන්නා

enter - එන්ට(ර්) - ඇතුළු වෙනවා

odd - ඔඩ් - අමුතු , නුහුරු

exchange - එක්ස්චේන්ජ් - හුවමාරු කරගන්නවා

interval - ඉන්ට(ර්)වල් - අතරතුර විරාමය , විවේක කාලය

care - කෙයා - සලකනවා

awkward - ඔක්ව(ර්)ඩ් - නුහුරු , අපහසු

alike - අලයික් - එක වගේම

timid - ටිමිඩ් - බයාදු

newcomer - නිව් කම(ර්) - අලුතෙන් ආ තැනැත්තා

get close - ගෙට් ක්ලෝස් - ලං වෙනවා

entrance - එන්ට්‍රන්ස් - පිවිසුම , ඇතුල්වන තැන

main - මේන් - ප්‍රධාන

instantly - ඉන්ස්ටන්ට්ලි - ක්ෂණිකවම

turn - ට(ර්)න් - හැරෙනවා

upper - අප(ර්) - ඉහල

climb up - ක්ලයිම් අප් - උඩට නගිනවා

climb down - ක්ලයිම් ඩවුන් - පහල බහිනවා

medium - මීඩියම් - මධ්‍යම

height - හයිට් - උස

stout - ස්ටවුට් - තරමක් තරබාරු , හොඳින් වැඩුණු

stare - ස්ටෙයා - රවා බලනවා

directly - ඩිරෙක්ට්ලි - කෙලින්ම

look away - ලුක් අවේ - අහක බලනවා

idiot - ඉඩියට් - මෝඩයා

approach - අප්‍රෝච් - ළඟා වෙනවා

gather - ගැද(ර්) - එකතු වෙනවා , එකතු කරනවා

around - අරවුන්ඩ් - අවට , වටේට

recognize - රෙකග්නයිස් - අඳුනා ගන්නවා

several - සෙවරල් - කිහිප , කිහිපයක්

scene - සීන් - සිද්ධියක් වන තැන , දර්ශනය

sneer - ස්නිය(ර්) - සරදම් සහගත ලෙස හෝ අපහාසාත්මක ලෙස බලා සිනාසෙනවා

burst out laughing - බ(ර්)ස්ට් අවුට් ලාෆින් - හිටිහැටියේ මහා හඬින් හිනාවෙනවා

ashamed - අශේම්ඩ් - ලජ්ජාවට පත්

shake - ෂේක් - සෙලවෙනවා , සොලවනවා , ගැහෙනවා (shook -අතීත )

tease - ටීස් - සරදම් කරනවා , විහිලු කොලොප්පන් කරනවා

fit (in ) - ෆිට් (ඉන්) - ගැලපෙනවා

giggle - ගිග්ල් - හිකි හිකි ගාල හිනාවෙනවා

instead - ඉන්ස්ටෙඩ් - ඒ වෙනුවට

thunder - තන්ඩ(ර්) - ගොරවනවා , ගුගුරනවා

angrier - ඇංග්‍රිය(ර්) - angry කියන වචනයේ “ඊටත් වඩා කේන්ති” යන තේරුම දෙන රූපය

utterly - අට(ර්)ලි - එහෙම්පිටින්ම

helpless - හෙල්ප්ලස් - පිහිටක් නැති , අසරණ

pity - පිටී - අනුකම්පාව / අනුකම්පා කරනවා

squad - ස්කොඩ් - පිරිවර , පරිවාර සෙනග

point - පොයින්ට් - පෙන්වා දෙනවා

order - ඕඩ(ර්) - අණ දෙනවා , අණ

pleasant - ප්ලෙසන්ට් - ප්‍රසන්න

decent - ඩීසන්ට් - විනය ගරුක

monitor - මොනිට(ර්) - අධීක්ෂණය කරනවා අධීක්ෂකයා , පන්තියක නායකයා

plead  - ප්ලීඩ් - ආයාචනා කරනවා

bully - බුලී - අනුන් බය ගන්වන්නා / අනුන් බය ගන්වනවා

ensure - එන්ෂුව(ර්) - සහතික වෙනවා

grin - ග්‍රින් - පුළුල් සිනහව , එසේ සිනා වෙනවා

let go  of  …- ලෙට්  ගෝ ඔෆ් …. - අතහරිනවා

leave - ලීව් - හැර යනවා ,පිටත්ව යනවා (left - ලෙෆ්ට් - අතීත )

pat - පැට් - අතින් තට්ටු කරනවා

speak - ස්පීක්  - කතා කරනවා   (spoke -ස්පෝක් - අතීත )

brave - බ්‍රේව් - බය නැති , නිර්භීත

bravely - බ්‍රේව්ලි - බය නැතිව , නිර්භීතව

afraid - අෆ්‍රේඩ් - බය

listen  to … - ලිස්න් ටු …- ඇහුම්කන් දෙනවා

dare - ඩෙයා - එඩිතර වෙනවා